''පුමිතිරි'' - ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ විද්‍යුත් සඟරාව
Online ISSN: 3051-4924
https://journals.sjp.ac.lk/index.php/pumithiri
වෙළුම: 2; II කලාපය; 2025 නොවැම්බර්; පිටු: 51-58

# වෛශ්‍යා වෘත්තියෙහි සමාජ නිරූපිතය පිළිබඳ ඓතිහාසික අධ්‍යයනයක්

**එම්. ඒ ප්‍රසාද් කුමාර**
මානවශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
prasadmallawaarachchi85@gmail.com

**සංක්ෂේපය**

පුරාණ ශ්‍රී ලංකාවේ සමාජ ඉතිහාසය අධ්‍යයනය කිරීමේදී කාන්තාවන්ගේ දායකත්වය විශේෂයෙන් වැදගත් වේ. මානව සමාජ ඉතිහාසයේ ආරම්භයේ සිටම, සමාජ, ආර්ථික, ආගමික සහ දේශපාලන ක්ෂේත්‍රවල කාන්තාවන් වැදගත් කාර්යභාරයක් ඉටු කර ඇත. පුරාණ ශ්‍රී ලාංකික සමාජයේ සන්දර්භය තුළ, පිරිමි කොටස පමණක් නොව කාන්තා කොටස ද සමාන තත්වයක් ලබා ඇත. දරුවන් රැකබලා ගැනීමට සහ ගෘහ රාජකාරි කළමනාකරණය කිරීමට පමණක් නොව, තමන් කැමති ඕනෑම වෘත්තියක නිරත වීමට කාන්තාවන්ට නිදහස තිබුණි. මේ අතරින්, ගණිකා වෘත්තිය මානව ඉතිහාසයේ ආරම්භය තරම් පැරණි වෘත්තියක් ලෙස මතු වූ අතර එය සමාජ අවශ්‍යතා නිසා පැන නැගී කාලයත් සමඟ ආයතනිකකරණය විය. එබැවින්, ගණිකා වෘත්තිය ලෝකයේ පැරණිතම වෘත්තිය ලෙස හැඳින්වේ. මෙම අධ්‍යයනයේ ප්‍රධාන පර්යේෂණ ගැටළුව වන්නේ පුරාණ ශ්‍රී ලංකාවේ ගණිකා වෘත්තිය තුළ කාන්තාවන් දැරූ සමාජ තත්ත්වය පරීක්ෂා කිරීමයි. මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ පුරාණ ගණිකා වෘත්තියේ සමාජ නිරූපණය හඳුනා ගැනීමයි. ද්විතියික අරමුණු අතර ගණිකා වෘත්තියේ ආරම්භය සහ සංවර්ධනය තේරුම් ගැනීම, එහි සදාචාරාත්මක මානයන් පරීක්ෂා කිරීම සහ සමාජ විෂමාචාර වැළැක්වීමේදී එහි බලපෑම විශ්ලේෂණය කිරීම ඇතුළත් වේ. මෙම අධ්‍යයනය සඳහා ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදයක් භාවිතා කරන ලදී. සොයාගැනීම්වලින් හෙළි වූයේ ගණිකා වෘත්තිය පුරාණ සමාජයේ සමාජීය වශයෙන් පිළිගත් වෘත්තියක් ලෙස පැවති බවයි. මෙම වෘත්තියේ නියැලී සිටින කාන්තාවන් තම අයිතිවාසිකම් භුක්ති විඳිමින් ගෞරවාන්විතව සහ ව්‍යුහගත පද්ධතියක් යටතේ සමාජයට තම සේවාවන් ලබා දුන්හ. එබැවින්, පුරාණ සමාජයේ ගණිකා වෘත්තියේ නියැලී සිටින කාන්තාවන්ට ගෞරවය හිමි වූ අතර, ඔවුන්ගේ සේවාවන්හි ගෞරවනීය ස්වභාවය නිසා, විනයගරුක සමාජයක් නිර්මාණය කිරීමට දායක විය.

**මුඛ්‍ය පද:** ආත්ම ගෞරවය, කාන්තාව, ගණිකාව, වෘත්තිය, විනය

## හැඳින්වීම

ලිංගිකත්වය මානව අවශ්‍යතාවකි. ඇතැම් විට එය ආදරය සහ ප්‍රේමය මත තහවුරු වන සුන්දර ක්‍රියාවලියක් වන අතර ඇතමෙකුට එය කායික අවශ්‍යතාවක් පමණක්ම වේ. අරමුණ කෙසේ වුව ද ලිංගික එකතුවීම් ගැහැණියෙකුටත් පිරිමියෙකුටත් බොහෝ වරප්‍රසාද ලබා දෙයි. විටක මානසික ඒකාග්‍රතාවත්, සතුටත් මෙන්ම ශාරීරික සුවතාවත් නිර්මාණය කරයි. විවාහය තුළ දෙදෙනෙකුට ලිංගිකව එකතු වීමට සදාචාරාමක අයිතියක් පවතින අතර එසේ නොවන අවස්ථාවල මුදලට හෝ වරප්‍රසාද ලබාදෙමින් එම අවශ්‍යතා ඉටු කර ගන්නා අයුරු වත්මන් සමාජය තුළ ද දැකි ය හැකි ය. අතීතයේ දී ද මෙවන් අවශ්‍යතා සමාජය තුළ කොයි කා අතරත් අඩු වැඩි වශයෙන් පැවති ආකාරය මූලාශ්‍රයගත සාධක අධ්‍යයනයෙන් පෙනී යයි. එලෙස වර්ධනය වූ සමාජ අවශ්‍යතාවන් නිසාම වෛශ්‍යා වෘත්තිය සමාජ පිළිගැනීමක් සහිත වෘත්තියක් ලෙස සමාජගතව පැවති අතර රාජ්‍ය පිළිගැනීමක් සහිත සමාජ වගකීමක් ඉටු කරන ස්වභාවයක් දැකිය හැකි විය. කිසිඳු අවස්ථාවක නීතිය හෝ සමාජය මගින් තහනම් වෘත්තියක සේ බැහැර කළ බවට සාක්ෂ්‍ය නොතිබීම, පිළිගත් නීති රීති සහ සම්ප්‍රදායන් මාලාවක් මත වෘත්තීමය ගරුත්වයක් ද එකතුපාදා කරමින් සමාජගත කර තිබීම සහ එකී වෘත්තිය පිළිකුල්සහගත සහ බැහැර කළ යුතු වෘත්තියක් සේ නොසළකා තිබීම සහ වෘත්තිනියක් ලෙස ඇගයීමට පාත්‍ර කිරීම වැනි කාරණා මත මෙකී වෘත්තිය වටා පිළිගත් සමාජ වගකීමක් ගැබ්ව පැවති බව පැහැදිලි වේ. වර්තමානය වන විට ද ලංකාවේ වෛශ්‍යා වෘත්තිය පිළිබඳ පවතින සමාජ මතය වෙනස් වී ගොස් සමාජයෙන් බැහැර කළ යුතු වෘත්තියක් වශයෙන් සළකා ඇති නමුත් නීතිමය රාමුවෙන් ඔබ්බට ගොස් ඒවායේ ක්‍රියාකාරීත්වයන් පිළිබඳ අසන්නට ලැබේ. ඇතැම්

විට නීතියෙන් වැට බැඳි වෛශ්‍යා වෘත්තිය වර්තමානයේ අපගාමී චර්යාවක් සේ වර්ධනය වීම නිසා ලිංගාශ්‍රිත රෝග වර්ධනය වීම වැනි බරපතල සමාජ ප්‍රශ්න බවට පරිවර්තනය වීමක් ද සිදු වී තිබේ. එනිසාම මෙකී පර්යේෂණ ලිපිය මගින් ශ්‍රී ලාංකේය ඉතිහාස ගමන්මග තුළ වෛශ්‍යාවකගේ වෘත්තීය ක්‍රියාවලිය සහ එහි සමාජගත බලපෑම පිළිබඳ ඓතිහාසික දෘෂ්ඨිකෝණයෙන් විමසා බැලීමක් සිදු කර ඇත.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම අධ්‍යයනයේ දී පර්යේෂණ ක්‍රමවේදය ලෙස ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යොදා ගැනිණි. දත්ත එක්රැස් කිරීමේ දී (Data Collection Method) ප්‍රාථමික සාහිත්‍ය මූලාශ්‍රය, සෙල්ලිපි, වැනි පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය අධ්‍යයනය සිදු කළ අතර දත්ත විශ්ලේෂණ ක්‍රමවේද වශයෙන් (Data Analysis Method) ඓතිහාසික සන්සන්දනාත්මක ක්‍රමවේදය (Historical Comparative Method), තේමා විශ්ලේෂණ ක්‍රමවේදය (Thematic Analysis Method) වැනි ක්‍රමවේද යොදා ගනිමින් නිගමනවලට එළඹීම සිදු කෙරිණි.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

සංස්කෘත භාෂාවේ දී 'වෛශ්‍යා' යන වචනයේ අර්ථය වෙළඳාමක යෙදෙන්නා යනුවෙනි. එහෙත් වෛශ්‍යාව යනුවෙන් හැඳින්වූයේ ලිංගිකත්වය වෙළඳාම් කරන කත යන අරුතිනි. කාන්තාවන් ආර්ථික සම්පත් ඉපැයීම අරමුණු කර ගනිමින් වෛශ්‍යා වෘත්තිය සිදු කරන ලද අතර මුදල් හෝ ආර්ථික වටිනාකමකින් යුත් ද්‍රව්‍යයක් හිමි කරගැනීම උදෙසා දන්නා හෝ නොදන්නා පුද්ගලයෙකු සමඟ භාවාත්මක හැඟීමකින් තොරව ලිංගික චර්යාවෙහි යෙදෙන්නිය 'වෛශ්‍යාව' ලෙස අර්ථනිරූපණය කළ හැකි ය. එසේ ම කිසියම් නියමිත ස්ථානයක, කාමරයක හෝ නිවාසයක ජීවත් වෙමින් වෛශ්‍යා වෘත්තියේ නිරත වන කාන්තාවන් 'වෛශ්‍යාවන්' වශයෙන් හඳුන්වන අතර ඔවුන්ට ආර්ථික හැකියාවක් සහ ආකර්ෂණයක් පවතී. එසේම සමාජය සමග පැහැදිලි සබඳතාවක් ගොඩනගාගෙන ඔවුන්ගේ ආරක්ෂාව යටතේ තම සේවාව ලබා දෙයි (පෙරේරා 2005:22). වාත්ස්‍යාන විසින් රචිත *කාම සූත්‍රය* නම් ග්‍රන්ථයෙහි ලිංගික ක්‍රියාකාරිනියන් වර්ගීකරණය කර ඇති අතර ගණිකා වෘත්තියෙහි වෘත්තියක් ලෙස නියැලෙන්නන්, සාත්තු සේවිකාවන්, දුෂ්චරිත ස්ත්‍රීන්, නැට්ටුක්කාරියන්, ස්වකීය පවුල අතහැර දමා ගිය ස්ත්‍රීන්, තම රූ සපුව විකුණා දිවිගෙවන්නියන් සහ ස්ථාවර වෙසඟනන් (වික්‍රමාරච්චි 1999:2005) යනාදී වශයෙන් දක්වා තිබේ. වෛශ්‍යා වෘත්තිය පිළිබඳව සිය අදහස ඉදිරිපත් කරන 'මාඩෝ' නම් සමාජ විද්‍යාඥයා මුදල් හා කිසියම් ආර්ථික දීමනාවක් උදෙසා විරුද්ධ ලිංගිකයන් අතර හෝ සමලිංගිකයන් අතර පවත්වනු ලබන ලිංගික සේවනය 'ගණිකා වෘත්තිය' යනුවෙන් හඳුන්වා ඇත (පෙරේරා, 2005). එමෙන් ම මුදල් ලබා ගැනීම අරමුණු කර ගනිමින් මිනිසෙකුට ලිංගික පහසුකම් සලසන්නියක් ලෙසින් ද වෛශ්‍යාව අර්ථ දක්වයි.

ලිංගික කාර්යය පවුලක අඹුසැමියන් අතර පමණක් සිදුවිය යුතු සදාචාරාත්මක ක්‍රියාවලියක් බව සම්මත සම්ප්‍රදායයි. ශුද්ධ වූ බයිබලයේ දැක්වෙන පරිදි දෙවියන් වහන්සේ විසින් මැවූ ප්‍රථම මිනිසාත් ගැහැණියත් දෙවියන්ට විරුද්ධව පවු කොට තහනම් ගසෙහි ඵල කෑ බව සඳහන් වන අතර (ජයසූරිය, 1998) මෙහි තහනම් ගසෙහි ගෙඩිකෑම යන්නෙහි ධ්වනිතාර්ථය නම් ප්‍රථම ස්ත්‍රී පුරුෂ සම්භෝගයයි. එදින පටන් ඔවුන් පවුලක් වශයෙන් සලකා දරුවන් වැදීමේ කාර්යය ගැහැණියටත්, පවුලේ නඩත්තුව උදෙසා දුක් මහන්සියෙන් ඉපැයීම පුරුෂයාට පැවරුණ අතර තම ලිංගික ආශාවන් සපුරා ගැනීමට අඹුසැමි දෙදෙනා ඔවුනොවුන් වෙත බැඳී පැවතුණු බව *බයිබලයේ* දක්වා තිබේ. කෙසේ වෙතත් සමාජය ක්‍රමයෙන් පරිණාමයට පත්වීමත් සමග ම ඇතැම් පුරුෂයන් ලිංගික අවශ්‍යතාවන් සපුරා ගැනීම සඳහා සමාජ සම්මත සම්ප්‍රදායෙන් ඔබ්බට ගමන් කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වෛශ්‍යා වෘත්තිය සමාජගත වූ බව දක්වා තිබේ. මෙසේ සමාජ අවශ්‍යතාව මත පැන නැගුණු වෛශ්‍යා වෘත්තිය අතීත සමාජය තුළ පිළිගත් සහ රටේ සමාජ-ආර්ථික සංවර්ධනයෙහි ලා දායක වූ ප්‍රධාන වෘත්තියක් බවට පත්ව තිබුණු බව පැහැදිලි වේ.

වෛශ්‍යාවකගේ දින චර්යාව සහ හැසිරීම් රටා කෙසේ විය යුතු ද යන්න පිළිබඳ වැදගත් විස්තරයක් වාත්ස්‍යායනගේ *කාම සූත්‍රය* නමැති ග්‍රන්ථයේ 6වන අධිකරණයෙහි දක්වා ඇත. එහි දැක්වෙන පරිදි වෛශ්‍යාවකගේ අනුරතිය මෙන් ම දිවිපැවැත්ම ද රඳා පවතින්නේ ඇය කරා පුරුෂයන්ගේ පැමිණීම ඇති තාක් පමණි. වෛශ්‍යාවකගේ ප්‍රේමය ව්‍යාඩ සහ කෘතිම එකක් වුවත් එය ස්වභාවික ප්‍රේමයක් සේ සේවය ලබන්නාට දැනවිය යුතු බව අවධාරණය කරයි. මෙම වෘත්තිය ද මුදල මත තීරණය වූ ගනුදෙනුවක් වන නිසාම ගනුදෙනුකරුවන් ගෙන්වා ගැනීම සඳහා වෛශ්‍යාව උපක්‍රමශීලී සහ සැලසුම්සහගතව හැඩගැසිය යුතු ය. වෛශ්‍යා වෘත්තියේ නිසිඵල නෙලා ගැනීමටනම් රූප සෞන්දර්යය පමණක්

ප්‍රමාණවත් වූයේ නැත. යොවුන් බව, ගායනය සහ වාදනය පිළිබඳ දක්ෂතාව වැනි රස විඳිය හැකි කුසලතාවන් ද ඇයගෙන් අපේක්ෂා කෙරිණි. *කාමසූත්‍රය* නම් ග්‍රන්ථයට අනුව ගණිකා යන වෘත්තීය නාමය හිමි වන්නේ උතුම් ස්වභාවය, රූප සෞන්දර්යය, මෘදුගුණය සහ සිව්සැට කාම කලාවන් හී නිපුණ තැනැත්තියකට පමණි. එම නිසා ගණිකාව යනු පුරුෂයන් සමග හුදු රමණයට ම පමණක් කැප වූ සුරූපී බොළඳ කතක් නොවිය යුතු බව සමාජ සම්මතය විය. ඇය විටෙක කාව්‍ය රචනයෙහි නිරත වන කාව්‍යයන් හි ගුණදොස් විවේචනයට සමත් තැනැත්තියකි. තවත් විටෙක ඇය ගායනය, වාදනය, නෘත්‍ය, චිත්‍ර ඇඳීම, මල්දම් ගෙතීම, දියකෙළීම, මල්යහන් සැදීම, මැහුම් ගෙතුම් විවීම පිළිබඳ අවබෝධය ද තිබිය යුතු බව දක්වයි. ඒ අනුව වෛශ්‍යා වෘත්තිය යනු කලාව, රසවින්දනය එකට මුහු කරන ලද කෞශල්‍යමත් ඉසුරු කතක් වූ බව පැහැදිලි ය. සෑම වෛශ්‍යාවක් ම මේ සෑම කලාවකට ම එක සේ නිපුණ වී සිටින්නට ඇතැයි සිතිය නොහැකි නමුත් එම ගුණාංග පිළිබඳ පරිචයක් තිබූ වෛශ්‍යාවන්ට සමාජයේ වැඩි සම්භාවනාවක් හිමිවන්නට ඇති බව උපකල්පනය කළ හැකි ය.

වෛශ්‍යා වෘත්තියෙහි ගෝලීය ප්‍රවේශයන් පිළිබඳ සාකච්ඡා කිරීමේ දී වෛශ්‍යාවන් පිළිබඳව මුලින් ම සඳහන් වන්නේ බැබිලෝනියානු ශිෂ්ටාචාරයෙන් ය. එනම් වීනස් දෙවඟන වෙනුවෙන් සේවය කිරීම පිණිස ගිල්ගමේෂ් ඉෂ්වර් නම් දෙවඟන ගණිකාවන්ට අධිපතීත්වය උසුලන බැවින් ඇය වෙනුවෙන් කැප වූ බව සඳහන් වේ. ක්‍රිස්තු පූර්ව 6වන සියවසේ දී ග්‍රීසියේ ගණිකා මඩම් රාජ්‍ය යටතේ පාලනය වූ අතර පුරවැසියන් වෙනුවෙන් රජය ගණිකාවන් මිළට ගෙන ඇත (තිලකසිරි 2008). රෝම ශිෂ්ටාචාරය තුළ ද වෛශ්‍යා වෘත්තිය සමාජගතව පැවති අතර ඔගස්ටස් අධිරාජ්‍යයාගේ පාලන අවධියේ දී වෛශ්‍යාවන් ලියාපදිංචි කිරීම ආරම්භ කරන ලදී (තිලකසිරි 2008:9). ජපානයේ ගණිකා වෘත්තිය එහි දිවිපෙවතක් වශයෙන් පිළිගත් අතර එම වෘත්තියට දෙමව්පියන්ගේ මැදිහත්වීමෙන් පවා පුරුදුපුහුණු කර ඇත (කාරියවසම්, 2021). වර්තමානයේ මෙන් වෛශ්‍යා සේවනය අතීතයේ නින්දාවට ලක් කිරීම හෝ සැඟවීම හෝ නොකරන ලදී (මුණසිංහ 1998: 93). ඇයගේ සේවනය පතා එන මිනිසුන් ඇයට ගෞරව කර ඇති අතර මෙම වෘත්තිය ලාභ උපයාගැනීම උදෙසා පැවැත්වෙන වෙළඳ ආයතනයක් බවට පත් ව තිබිණි (රසල්, 1996). තාත්කාලීන භාරතීය සමාජයේ වෛශ්‍යා වෘත්තීය පහත් කොට නොසැලකු බව මූලාශ්‍රය ඔස්සේ තහවුරු වී ඇත. විශේෂයෙන් බුද්ධ කාලීන භාරතයේ විසූ අම්බපාලි, අඩ්ඪකාසී, සාලවතී, සිරිමා යන වෛශ්‍යාවන් සමාජය තුළ පිළිගැනීමට ලක් වුත්, යස ඉසුරින් ආඪ්‍ය වූත් කාන්තාවක් ලෙස ජීවත් වූ බව පැහැදිලි වේ. ආර්ථික වශයෙන් පොහොසත් වූ ඔවුන් නිසා රාජ්‍ය භාණ්ඩාගාරයට විශාල ආදායමක් ලබාදුන් වෘත්තියක් වශයෙන් පැවත ඇත. එමෙන් ම රජයේ මැදිහත් වීමෙන් වෛශ්‍යාවන්ගේ කටයුතු හා වගකීම් සුරක්ෂිත කිරීම උදෙසා ගණිකා දෙපාර්තමේන්තුවක් පවා පැවතුණු ආකාරය *කෞටිල්‍යයගේ අර්ථ ශාස්ත්‍රය* තුළ සඳහන් කරයි. ඒ අනුවලෝකයේ බොහෝ ශිෂ්ටාචාරයන්හි සහ සමාජයන්හි වෛශ්‍යා වෘත්තිය පිළිගත් සමාජ වෘත්තියක් ලෙස සමාජගත කරන්නට ගත් ප්‍රතිපත්තිමය සහ සදාචාරාත්මක උත්සාහයන් පිළිබඳ අවබෝධයක් ලද හැකි වේ.

**වෛශ්‍යාවකගේ සමාජ ක්‍රියාකාරීත්වය සහ වෘත්තීය ගරුත්වය පිළිබඳ ඓතිහාසික සාධක**

ක්‍රි. පූ. තුන්වන සියවසේ සිටම මෙරට සමාජ ක්‍රමය තුළ වෛශ්‍යාවන් සේවය කළ බවට පූර්ව බ්‍රාහ්මීය ශිලා ලේඛනවල වලින් තොරතුරු අනාවරණය වේ. 'ශොබිකා නග කාමින මරු කතන නට චූලහ' (Inscription of Ceylon Vol. I, 1970) යනුවෙන් සැස්සේරුව බ්‍රාහ්මීය ශිලා ලේඛනයේ සඳහන් වන අතර එහි 'චූල' නමැති නළුවා තමාව හඳුන්වා ඇත්තේ නගර සෝභනියකගේ මුණුපුරා ලෙසයි. මේ ලිපිය තුළ සඳහන් වන චූල නමැති පුද්ගලයා ඔහුගේ අනන්‍යතාව පෙන්වාදීමට වෛශ්‍යාවක් වූ තම මිත්තණියගේ මුණුපුරා ලෙස සඳහන් කර ඇත. එයින් ප්‍රකට වන්නේ තම පරපුර වෛශයාවකට සම්බන්ධ කරමින් හඳුන්වා දීමට තරම් මෙකල වෛශ්‍යා වෘත්තිය පිළිගත් සමාජ මට්ටමක පැවති බවයි. සීගිරියෙන් හමුවූ ලෙන් ලිපියක ද එම ලෙන කරවන ලද්දේ 'සල' නමැති සියඹලා වෙළෙන්දෙකු හා 'තොස' නමැති වෛශයාවක විසින් බව පැහැදිලිවම දක්වා ඇත. 'අබල- වාබර සලහ ලෙණෙ වෙසාය් තොසවච''(සියඹලා ව්‍යාපාරික සලගේ හා වේශ්‍යා තොසාගේ ද ලෙණ) (මුදියන්සේ, 2000) මේ අනුව තමා වෛශ්‍යාවක් බව ප්‍රසිද්ධියේ ම කියාපෑමට තරම් ස්ත්‍රියක නිර්භය වීමෙන් පැහැදිලි වන්නේ බුදුසමය මෙරටට හඳුන්වා දුන් මුල් අවධියේ වුවද වෛශ්‍යාවන් සමාජ සම්මත වෘත්තියක ඉහළ සමාජ පිළිගැනීමකින් සහ අභිමානයකින් වැජඹුණු බවයි. ඇය සමාජය සමඟ සුහදව කටයුතු කරමින් සිය සේවාව සැපයූ අතර ඇයට හිමි විය යුතු තැන සමාජය විසින් සළසා දුන් ආකාරය මෙම නිදර්ශන මගින් අධ්‍යයනය කළ හැකි වේ. භික්ෂු සංස්ථාවේ

අභිවර්ධනය උදෙසා ලෙනක් කරවා පූජා කිරීමෙන් ඇය සතු ආර්ථික ශක්තිය පැහැදිලි වන අතරම බුද්ධ ශාසනයට ලෙනක් පරිත්‍යාග කිරීමට අවකාශ හිමිවීමෙන් ඇය ආගමික සහ ආධ්‍යාත්මික වශයෙන් ලත් ශික්ෂණය ද අවබෝධ කර ගත හැකි වේ. ආර්ථික තිරසාරත්වය උදෙසා වෘත්තීමය කාර්යභාරයක නියැලෙන අතරතුර ඇය ආගමික සංවර්ධනය වෙනුවෙන් ද සමාජ සංවිධානය වෙනුවෙන් ද සිය දායකත්වය නොපැකිලව ලබා දී ඇත.

අභිලේඛන මූලාශ්‍රය මගින් මෙන්ම වංසකතාගත සාහිත්‍යයෙන් ද මෙරට වෛශ්‍යා වෘත්තියෙහි සමාජ භාවිතාවන් පිළිබඳ බොහෝ තොරතුරු අනාවරණය වන අතර ඒවා විශ්ලේෂණය කර බැලීමෙන් වෛශ්‍යයා වෘත්තිය සමාජ ගැටලු විසඳීමෙහි ලා කෙතරම් දායක වූයේ ද යන්න පිළිබඳ නිගමනයකට එළඹිය හැකි ය. කුමාරදාස රාජ්‍ය අවධියේදී ලක්දිව වෛශ්‍යා වෘත්තීය පිළිගත් සමාජ වෘත්තියක් සේ සමාජගතව පැවති ආකාරය පිළිබඳ *නිකාය සංග්‍රහයෙන්* තොරතුරු ඉදිරිපත් වේ. නීලපට දර්ශනය පිළිබඳව සඳහන් කරන නිකාය සංග්‍රහයේ එම විස්තරය ආරම්භ කරන්නේම සමාජයේ ක්‍රියාශීලීව වෘත්තියේ නියැලුණු වෛශ්‍යාවන් පිළිබඳව සඳහන් කරමිනි. එය උපුටනයක් ලෙස පහතින් ඉදිරිපත් කර අත.

'මෙරට යට කී කුමාරදාස රජ දවස දඹදිව දක්ෂිණ මධුරාවෙහි ශ්‍රී හර්ෂ නම් රජෙක් විය. එකල සම්මිතතිය නිකාය වාසී වූ නුවණැති සැදැහැනැති දුෂ්ට මහණෙක් එක් රාත්‍රී භාගයෙහි නිල් වස්ත්‍රයක් පෙරව වෛශ්‍යා වාසයකට ගොස් එහි ලැග පහන්ව ගිය කල විහාරයට ආයේ ය. මේ වෙශය යහපත්දැයි විචාලහ. එකල ඒ තමා ගත් වෙශය බොහෝ දෙනා දුටු හෙයින් එම ප්‍රශංසා කොට එහි අනුසස් කීහ. එතෙපුල් අසා ඔහුගේ වචනකර භික්ෂූහු සිවුරු හැර නිල්පිළි පෙරවියහ. ඉක්බිති එතෙම විදග්ධ වෛශාංගනාවන් හා අනවස්ථිත සුරාපානය හා කාමදේවයා හා තුන භුවනත්‍රයෙහි අසාධාරණ රත්නය යි තබාගෙන ඊට නමස්කාර කිරීමෙන් සෙසු රත්නයන් කදාපහණ සේ නිසරු කොට දක්වා නීලපටදර්ශන නම් වූ ග්‍රන්ථයක් රචනා කළේ ය (නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය, 1987).

මෙම ඓතිහාසික සංසිද්ධිය විග්‍රහ කරන විට එකල වෛශ්‍යා වෘත්තියෙහි සාධනීය තත්ත්වයන් රැසක් ලඝු කොට හඳුනාගත හැකි ය. ඉන් එකක් වන්නේ සමකාලීන අවධියේ ලිංගික ක්‍රියාකාරිකයන්ට සමාජයේ ඉඩක් පැවැති බව සහ ඇය සේවා දායකයාගේ අවශ්‍යතාව උපරිම අයුරින් ඉටු කර දීමට උත්සාහ ගත් බව ය. වෘත්තීය සේවා සැපයීම කෙතරම් කාර්යක්ෂම සහ සුරක්ෂිත ක්‍රියාදාමයක් වූයේ ද යත් ඇයගේ සේවාව ලබා ගැනීම සඳහා රජවරු, රජ කුමාරවරු, සිටුවරු ආදී උසස් ප්‍රභූන් මෙන්ම සාමාන්‍ය ජවනතාව ද ඒ කෙරෙහි ඇදී ගිය බව තොරතුරු අනාවරණය වේ. රජවරුන් ඇයගේ සේවාව ලබා ගැනීමෙන් පැහැදිලි වන්නේ රාජ්‍ය ප්‍රතිපත්ති සම්පාදනය තුළ වෛශ්‍යාවගේ වෘත්තීය සංවර්ධනයට රාජ්‍ය අනුග්‍රහය වඩාත් හොඳින් පැවති බවයි. ලිංගික සූරාකෑමක් කිසිවටෙක සිදු නොවුණ අතර ලබා ගන්නා සේවයට සරිලන වැටුපක් ඇය වෙත හිමි කර දීම වඩාත් සාධාරණ සහ යුක්තිගරුක තත්ත්වයකි. උදාහරණ වශයෙන් සඳ එළියේ මහ මග ඔබ මොබ යන අභිසරුලියන් දුටු මහාතිත්ථයේ සිව ඇමතිවරයා කහවණු 3000ක් සුරූපි ළඳකට යවනු ලැබීමෙන් සඳලු තලයට ගෙන්වා ගත් බව *සියබස්ලකරෙහි* දක්වා තිබේ. කාන්තාවක් ලෙස සමාජය හමුවේ වෘත්තීය නිදහසක් සහ අභිමානයක් නිතැතින්ම ඇයට හිමි වූ අතර ඇයගේ මානව සහ වෘත්තීය අයිතිවාසිකම් කිසිදු විටෙක කඩවීමකට ලක් වී ඇති බවක් පෙනෙන්නට නැත. වෛශ්‍යාවගේ සේවාව සේවා ලාභියා විසින් ප්‍රශංසාවට ලක් කිරීම වෘත්තීමය අභිමානයක් සහ සතුටක් ඇය වෙත හිමි කර දීමට සමත් වන අතර තවත් අතකින් ඇයගේ සේවාව ලබා ගැනීමට සමාජය දිරිමත් කිරීමක් ද සිදු කර ඇත. සමාජ ගැටලු සමතයට පත් කරමින් සාදාරණ සමාජයක් නිර්මාණය කිරීමට මෙකී ක්‍රියා පිළිවෙත් තුළින් මගහසර විවර වුණු බව ද ඉතාමත් පැහැදිලි කරුණකි.

වෙසඟන වෘත්තිය කෙතරම් සමාජ පිළිගැනීමකට ලක්ව පැවතියේද යත් පැරණි රජවරුන් විසින් වෛශයා වෘත්තියෙහි ස්ථාවරත්වය උදෙසා වෙන් වෙන් ගම් සහ නගර නිර්මාණ කිරීම් පිළිබඳව ද ඓතිහාසික සාධක හමුවේ. උදාහරණ වශයෙන් පොළොන්නරු රාජ්‍ය අවධියේ දී මහා පරාක්‍රමබාහු රජු 'රාජ වේසි භුජංග' නම් ශාඛා නගරයක් කරවූ බව *මහාවංසයේ* සඳහන් වීම දක්විය හැකි ය. එමගින් වෛශ්‍යාවන් වෙනුවෙන් රජු දක්වන ලද අනුග්‍රහශීලීත්වය හඳුනාගත හැකි වේ (මහාවංසය 1996: පරි 71,53 ගාථා). වෛශ්‍යාවන් කායික සංතර්පණය සඳහා මුදලට ක්‍රියා කිරීම පංචශීල ප්‍රතිපදාව බණ්ඩනය කරන ක්‍රියාවලියක් වුවත් ඒ හේතුවෙන් ඇය සමාජ අපවාදයට ලක් වූ බවක් කිසිදු ඓතිහාසික ග්‍රන්ථයකින් තොරතුරු ඉදිරිපත් වන්නේ නැත. ධර්මසේන හිමියන් විසින් දඹදෙණි අවධියේ දී

රචනා කරන *සද්ධර්මරත්නාවලියෙහි* සිරිමා වස්තුවේ 'නිකෘෂ්ට වූ වේශ්‍යාකම් කොට ඇවිදිනා තොපට'(සද්ධර්මරත්නාවලිය, 1996) යනුවෙන් සිරිමා වෛශ්‍යාවට උත්තරාවගේ දාසියන් බැණ වදින විට ඇය අධ්‍යාත්මික වශයෙන් පොහොසත් තැනැත්තියක බව පෙන්වා දීමට ගත් උත්සාහය රසාලිප්තව විස්තර වී තිබේ 'ඒ සිරිමාවන් බුදුන්ගෙන් බණ අසා සෝවාන් වූ තැන් දක්වා සෝවාන්වැලා බුදුන්ට ආරාධනා කොට දෙවන දවස් මහන් දි වහන්දැට ලාබත් අටක් තබා දුන්හ.' යනුවෙන් ඇය ආධ්‍යාත්මික ශික්ෂණය ලත් ආකාරය විස්තරාත්මකව ඉදිරිපත් කර ඇත.

වෛශ්‍යාවන් මුදලට තම සේවාව සැපයීම සිදු කළත් එම ක්‍රියාවලියේ රහස්‍යභාවය ද වඩාත් අපේක්ෂා කළ බවට සාධක ඓතිහාසික ලේඛනවලින් හඳුනාගත හැකි වේ. ලිංගික ක්‍රියාවලිය අවබෝධාත්මක ගණුදෙනුවකි. එහි රහස්‍යභාවය සුරක්ෂිත වීම පුද්ගලල ආත්ම ගෞරවය උදෙසා අතිශයින් හේතු වන අතර අයිතිවාසිකම් උල්ලංගනය නොවීම කෙරෙහිද තීරණාත්මක සාධකයක් වේ. ඇතැම් අවස්ථාවල නාගරික අභිසරුලියන් එක්තරා බියකින් සහ සැකයකින් තම වෘත්තියෙහි නියැලුණු අවස්ථාවන් පිළිබඳව ද සාධක ලැබේ. 'දහවල් සෙයින් රැයිදු නොගත් සිතෙ පුරවර- අබිසරුවන් පියුම් රාමිණි වැනි රස් දිදුලෙන්"(මුවදෙව්දාවත, 2015) යනුවෙන් *මුවදෙව්දාවතෙහි* එන සඳහන මෙහි ලා විශේෂ වේ. පද්මරාග මාණික්‍යය කොත්වල රශ්මියේ දීප්තියෙන් ඒ පුරවරය දහවල් මෙන් ම රැයෙහි ද ආලෝකවත්ව ඇති නිසා නගරය අභිසරුවන්ගේ සිත් නොගත්තේ ය යනුවෙන් දැක්වෙන සඳහන අනුව වෛශ්‍යාවන් ආලෝකයට ප්‍රිය උපදවා නොමැති බව පැහැදිලි වේ. අඳුර විශ්වසනීය ලිංගික ඇසුරකට හේතු වුවත් ආලෝකය එහි විශ්වසනීයත්වය බිඳ හෙළයි. ආලෝකය ලිංගික ක්‍රියාවලිය තවකෙකුගේ ඇස ගැටීමට හේතුවක් වන අතරම එය වෘත්තීය ගරුත්වයට සහ ආත්මාභිමානයට බාධාවකි. දහවල අභිසරුවන්ගේ සිත් නොගත්තේ ඔවුන් යන එන තැන් වෙනත් අයට පෙනෙන හෙයිනි. ආලෝකයෙන් යුතු රෑ කාලය ඔවුන්ගේ සිත් නොගත්තේ ද ඒ කරුණු නිසා ය. මෙයින් පැහැදිලි වන්නේ ආලෝකයෙන් තොර රෑ කාලය ඔවුන් ප්‍රිය කළ බවයි. ඒ ඔවුන්ට වෙනත් අයට නොපෙනෙන සේ සිය වෘත්තියෙහි යෙදිය හැකි වූ නිසාවෙනි. ඒ අනුව සේවාව වෙනුවෙන් ඇය අපේක්ෂා කළ රැකවරණ ප්‍රමාණයක් ද පැවති බව පැහැදිලි වේ.

*මයුර සංදේශයේ* (මයුර සන්දේශය 1987: 09වන කවිය) ගණිකාවන් ප්‍රසිද්ධියේ නොහැසිරුණු බව ට සාධාරණය කළ හැකි සාධක ලැබේ.

'එපුරෙහි සරන අබිසුරු ලිය සොර බැවිනි
සොබමින් විමන් දොර මිනි පහණ වසමිනි
මල් දම් සුඹුල කැරු ගත් සලගත් අතිනි
ගල මිනි පැමිණි පණිඳකු ගත් එකග වැනි '

මෙම කවියෙහි විස්තර වන ආකාරයට නගරයෙහි වසන අබිසරුලියන් නිවෙස් ඉදිරිපස රාත්‍රියෙහි තබා ඇති පහන් එළියෙන් තමා පෙනේවි යැයි යන බියෙන් ඒ පහන් එළිය අතින් මුවා කළේ කණ්ඨ මාණික්‍ය සහිත නාගයෙකු ගුරුලෙකු විසින් අල්ලා ගනු ලැබුවාක් මෙනි යනුවෙන් දක්වා තිබේ. එනිසා තමාගේ ලිංගික සේවාව ලබා දීමේ දී එය ඉතා රහසිගත සහ සැලසුම්සහගත ක්‍රියාවක් ලෙස සේවා ලාභියාට ලබා දෙන්නට ඇය නිතරම උත්සාහශීලී වූ බව පැහැදිලි වේ.

ඕනෑම වෘත්තියකට සේවාව සැපයිය යුතු කාල පරාසයක් පවතින අතරම එම කාල පරාසය තුළ තම ශ්‍රමය ආර්ථික ශක්තිය වෙනුවෙන්ම වැය කරති. වෛශ්‍යාවගේ සේවා කාලය රාත්‍රියයි. රාත්‍රී කාලය ගෙවී යාම ඇයගේ සතුටට බාධාවක් වන බව සහ ඇය ආර්ථික සංවර්ධනය උදෙසා දිගු සේවා කාලයක් අපේක්ෂා කළ බවට ද සාධක මූලාශ්‍රයවලින් ලැබේ. 'කම් වමියන් ළෙහි පහළත සෙදි පියසන් -කනොත රත්යවුල් මෙන් පළ රැවු කෙළේ තඹසිළු'' යනුවෙන් *සසඳාවතෙහි* සඳහන් වන අතර රෑ කාලය ගෙවී යාම අභිසාරිකාවන්ගේ සිතට වේදනා ගෙන දෙන්නක් වූ බව එහි අර්ථයයි '(සසඳාවත 1996). කුකුළන් පියාපත් ගසන විට නැගෙන ශබ්දය ඔවුන්ගේ පපුවට පහරදීමක් ලෙස දැබව දක්වා තිබීමෙන් රාත්‍රී කාලයට ඇය දක්වන ලද ප්‍රියතාව කෙතරම් ද යන්න වටහා ගත හැකි වේ. මේ තුළ පවතින්නේ කාමුකත්වය පිළිබඳ ආශාව නොවන අතර ආර්ථික වශයෙන් ආදායම් උපයා ගැනීමේ ඒකායන අරමුණ පමණි. ඒ වෙනුවෙන් සාධාරණ සේවාවක් සැපයීමට ඇය සූදානම් වී සිටින බව මේ අනුව පැහැදිලි වෙයි.

පවුල් කුටුම්බය තුළ ආර්ථික ප්‍රශ්නවලට මුහුණ දුන් කාන්තාවන් එයින් මිදීම සඳහා වෛශ්‍යා වෘත්තියෙහි නියලුණු අවස්ථාවන් පිළිබඳව ද සීගිරි කුරුටු ගී මගින් අනාවරණය වේ. 'පිරිබුන හුණස්වින මෙසෙස් නසිනො අයුයුත් හස් තී කළ කිමද හිමිය හිඟදෑ...'' යනුවෙන් දැක්වෙන කුරුටු ගීයට අරුත් සපයන සෙනරත් පරණවිතානයන් මෙහි ආවුත් සමග තී

කුමක් කළේද? එසේ හැසිරෙන්නේ තිගේ සැමියාගේ අතමිට හිඟ වූ නිසාදැයි යනුවෙන් අසා ඇති බවත් දක්වයි (ජයසූරිය, 1998). ඒ අනුව අතමිට හිඟ වූ ඇතැම් ගැහැණුන් මුදල් වෙනුවෙන් ලිංගික ක්‍රියාවන්හි යෙදී ඇති බව පැහැදිලි වන අතර ආර්ථික වශයෙන් පීඩාකාරී තත්වයන් හමුවේ ඉන් මිදීමට මෙම වෘත්තිය තෝරා ගත් බව ද මේ අනුව පෙනෙන්නට තිබේ. පවුල් කුටුම්භියේ ආර්ථික ප්‍රශ්න නිරාකරණය උදෙසා වෛශ්‍යා වෘත්තිය තෝරා ගැනීමෙන් පෙනෙන්නේ සමකාලීනය මෙම වෘත්තියට හිමිව තිබූ ආර්ථික වටිනාකමයි. වැඩි ආදායම් උපදන රැකියා ක්ෂේත්‍රයක් ලෙස වෛශ්‍යා වෘත්තිය ශ්‍රේණිගතව පැවති බව මේ අනුව පැහැදිලි වේ.

අභිසාරිකාවන් තම සේවාව සැපයීම සෑම ස්ථානයකදීම සිදු නොකළ අතර එසේ සේවා සැපයීම වෙනුවෙන් තෝරා ගත් ස්ථාන පිළිබඳව ද ස්ථාන නාම විස්තරයක් 'ක්ෂේත්‍රං වාටි භජන දේවාලයෝ දූතිගෘහං වනං-මාලයංච ශ්මශානංච නදසාදී නං තටී යථා' යනුවෙන් මයුර සන්දේශයේ දක්වා තිබේ. ඒවානම් කෙත, උයන, ගරාවැටුණු දෙවොල, පෙම්වතුන් අතර පණිවිඩ ගෙන යන ස්ත්‍රියගේ නිවස, කැලය, වන්දනාකරුවන් ආදින් සඳහා වෙන් වූ වන පෙදෙස්, සොහොන් බිම් හා ගංඉවුරු යන ස්ථානයි (මයුර සන්දේශය, 2018). මෙම ස්ථාන සියල්ලම ඇයට නිදහසේ සහ රහසිගතව සිය සේවාව සැපයිය හැකි පාරසරික වශයෙන් වුව මනස උත්තේජනය වන ස්ථාන වන බව පැහැදිලි ය. ලබා දෙන සේවාව කායික සතුට මෙන්ම මානසික උත්තේජනයක් බවට පත් කිරීමට ඇය නිරන්තරයෙන් උත්සාහ ගත් ආකාරය මේ අනුව අධ්‍යයනය කළ හැකි වේ. අබිසාරිකාවන් තම වෘත්තීය සේවාව අත්මාභිමානය ද රැක ගනිමින් ලබා දීමට ගත් උත්සාහය පිළිබඳ තවත් සාක්ෂ්‍යයක් *මයුර සන්දේශයෙන්ම* ඉදිරිපත් වේ.

'බියෙන් බිසරුවන් වේ මග බැස සරත
වසන් සියන රසිනලු කළ රුවන් කොත
ලමින් එදැක අද සීකර නුඹේ ගත
පහන් වෙතී උන් නොපහන් නොකර සත ' (මයුර සන්දේශය, 2018)

මෙම කවියෙන් දැක්වෙන ආකාරයට ගම්පොළ ආසන්නයේ වූ අම්බුළුවාකඩින් ගමන් ආරම්භ කරන මයුරා කැළණිපුරයට පිවිසෙයි. එහිදී මයුරාට දක්නට ලැබෙන්නේ මිනිසුන් සොයාගෙන රාත්‍රී කාලයේ රහසින් යන අබිසරුලියන් පුරවරයේ ඇති මැණික් කොත්වලින් විහිදෙන රශ්මිය නිසා බියට පත්ව ඇති ආකාරයයි. මේ දුටු මොණරා අභිසාරිකාවන්ගේ බිය පහ කිරීමට පින්නෙන් තෙත් වූ සිය සිරුරෙන් මැණික් කොත ආවරණය කිරීමට උත්සාහ ගන්නා ආකාරය රසාලිප්තව ඉදිරිපත් කර ඇත. මේ තුළින් පැහැදිලි වන්නේ මෙකල සමාජයේ වෛශ්‍යා ඇසුර රාත්‍රී කාලයේදී සම්මතව පැවති බවයි. එමෙන් ම අබිසරුවන් අලෝකය නිසා බියෙන් හැසිරීම තුළ අප්‍රසිද්ධියේ මෙම වෘත්තිය පැවතුණු බවත් තම අනන්‍යතාව රැකගැනීමට හෝ සමාජ සම්මතයට එකඟව රාත්‍රී කාලයේදී ලිංගික වෘත්තිය සඳහා වෛශ්‍යාවන් යොමු වූ බව පැහැදිලි වනු ඇත.

අභිසාරිකාවන් සිය සේවාව සපයන අවස්ථාවේ තම ආත්මාරක්ෂාව සළසා ගත් ආකාරය පිළිබඳ අපූර්ව සාධකයන් ද සංදේශ සාහිත්‍යයෙන් ඉදිරිපත් වේ. මෙම කාන්තාවන් සිය සේවාව සපයන්නේ එම සේවාව ඉල්ලා පැමිණෙන නන්නාදුනන පුරුෂයන් වෙත ය. ඔවුන් කුමන පුද්ගලයන් ද යන්න පිළිබඳ පැහැදිලි තක්සේරුවක් අභිසාරිකාවන් තුළ නොවන නිසාම තමාගේ ආත්මාරක්සාව පිළිබඳව ද කල්පනාකාරී වෙමින් සිය සේවාව සැපයීමට තරම් ඇය බුද්ධිශීලී වූ බවට සාධක *තිසර සන්දේශයෙන්* (තිසර සන්දේශය 1986ඃ 45 කවිය) ලැබේ.

'මන් ලෙස යනෙන එහි අබිසරුව සිය ගත
නන් මිණි බරණ නුලුව ද අලු බියෙන් පත
උන් තුනු කැලුම් උන්ට ම බිය කෙළෙ නැවත
ඉන් තම අයති නොම වනු නියති සිය ගත'

මෙහි සඳහන් වන ආකාරයට රාත්‍රියෙහි පුරුෂයා සොයාගෙන යන්නා වූ වෛශ්‍යාවන් මැණික් ආභරණ නොපළඳවා ඔවුන් වෙත යාමට පියවර ගෙන ඇත. ඇතැම් විට ඒවා සොරසතුරන්ගේ ග්‍රහනයට ලක්විය හැකිය යන්න ඔවුන්ගේ සිත තුළ පැවති නිසා ජීවිතාරක්ෂාව සඳහා එවන් පියවරක් අනුගමනය කළ බව ඉතාමත්ම පැහැදිලි ය. එහෙත් සන්දේශය තුළ දක්වන්නේ සඳ එළියේ කාන්තියට මැණික් ආභරණ දිළිසෙන විට රහසිගත ලිංගික ක්‍රියාවලියට එය බාධාවක් වන නිසා ඔවුන් ආභරණ නොපැළඳි බවකි. එහෙත් සත්‍ය වශයෙන්ම සිදු වී ඇත්තේ නන්නාදුනන පුද්ගලයන්ගේ ස්වභාවය පිළිබඳ තක්සේරුවක් ඇය සතු නොවන නිසා හැකි සෑම විටම ආරක්ෂාකාරීව සහ උපක්‍රමශීලීව සිය සේවාව ලබා දීමට තරම් ඇය ප්‍රඥා සහගත වූ බව ය. අභිසාරිකාවන්ගේ අරමුණ බවට පත්වූයේ කෙලෙසක හෝ සිය සේවාව පුරුෂයන් වෙත ලබා දීම වන අතර ඒ සඳහා පොළඹවා ගැනීමට ඇය හැකි සෑම

උපක්‍රමයක්ම දියත් කරයි. එළෙසේ උත්සුක වීම පසුපස තිබෙන ඒකායන අරමුණ ධනය හරිහම්බ කර ගැනීමයි. මේ බව දත් ඇතැම් පුරුෂයන් තම ධනය විනාශවන ක්‍රියාවක් සේ සලකා අභිසාරිකාවන් ප්‍රතික්ෂේප කළ ආකාරය පිළිබඳව ද සන්දේශ සාහිත්‍යයෙන් තොරතුරු ලැබේ. තිසර සන්දේශයේ දක්වෙන පහත සඳහන් කවිය ඒ සඳහා නිදර්ශන සපයයි.

'සැදී සිටින මද යුදයට සේරුවල
නිසි අඟනන් යුත් සුරගන සේරුවල
රැඳී වෙළඳුන් වන් නිසලින් මේරුවල
දැක යා ගන් සව්සිරි බර බේරුවල' (තිසර සන්දේශය 1986: 97 කවිය)

ඉහත කවියේ දක්වන ආකාරයට බේරුවල වෙරළෙහි සැරිසරන අභිසාරිකාවන් ධීවර වෙළෙන්දන් තම වසඟයට ගැනීමට උත්සාහ කළත් නමුත් බේරුවල වෙළෙන්දෝ මොවුන් ඉදිරියේ මහාමේරු මෙන් නිශ්චල බව දක්වයි. අභිසාරිකාවන් වෙළඳුන්ගෙන් මුදල් ලබාගැනීම අපේක්ෂා කරමින් මෙම ක්‍රියාවේ යෙදෙන බව වටහා ගත් නිසා මෙසේ වෙළෙන්ඳන් ඔවුන්ව ප්‍රතික්ෂේප කරන බව එහි වැඩිදුරටත් සඳහන් වේ. එනිසා වෛශ්‍යාවන්ට තම සේවාව අපේක්ෂා කරන පුරුෂයකු සොයා ගැනීම සඳහා අතිශය සංවිධානාත්මක උපායශීලී පිළිවෙත් අනගමනය කරන්නට සිදු වූ බව මේ අනුව පැහැදිලි වේ.

ඇතැම් අවස්ථාවල වෛශ්‍යාවන්ගෙන් ප්‍රවේශම් විය යුතු බවට උපදෙස් ලබා දීම් පිළිබඳව ද ජන සාහිත්‍යයෙන් තොරතුරු ඉදිරිපත් වෙයි. පහළ ඌවේ ජනකවියක වෛශ්‍යාවගේ උගුල්වලින් බේරී සිටීමට උත්සාහශීලී විය යුතු බවට දිරිමත් කිරීමක් දැකි ය හැකි ය.

'ආසා වෙලා කුමටද නුඹ ඇවිදින්නේ
ආසා උනත් වේසා ලිය අනුන්ගේ
හී සා නා ගොන් එක මඟද යන්නේ
වේසා ලියන් සිටි අසලින් නොයන්නේ ' (බණ්ඩා 1986:79)

පුරුෂයාට හැඟීම් දැනීම් ඇති විය හැකි ය. ඇතැම් විට ලිංගික ආශාවන් සන්තර්පණය උදෙසා ඔහු අභිසාරිකාවන් සොයා ගමන් කළ හැකි ය. එහෙත් අබිසාරිකාවන්ට එක් පුරුෂයකු නැත. හමුවන සැම තඅනම මුදලට සේවය සපයන ඇයගෙන් ස්ථිර යමක් අපේක්ෂා කළ නොහැකි ය. එනිසාම අනුන්ගේ වේසාලිය සොයා අසළින්වත් ගමන් නොකළ යුතු බවට මෙම ජනකවියේ උපදෙස් ලබා දී තිබේ. එනිසා ඇයගේ ඇසුර වෙත ඇදෙන පිරිමි දරුවන් වාරණය කිරීමට සමාජය විසින් දරණ ලද උත්සාහයක් පිළිබඳව ද මේ අනුව අධ්‍යයනය කළ හැකි වේ. ඇතැම් අවස්ථාවලදී විවාහය තුළ වුව පිරිමි රැසකගේ පහස විඳිමින් ආර්ථික ශක්තීන් උත්පාදනය කළ මව්වරු පිළිබඳවත් ජන කවි සාහිත්‍යයෙන් තොරතුරු ලැබේ. මවක් සිය දියණියට තමා ලිංගික ජීවිතය විඳි ආකාරය පිළිබඳ කවියකින් විග්‍රහ කළ ආකාරය පහත කවියෙන් ඉදිරිපත් වේ.

'මමත් දුවේ එක දීගෙක නූන්නෙමි
සැටක් පිරෙන තුරු දුටුවන් වැලැන්දෙමි
නුඹලා වගේ අඩුපාඩුත් නොම කළෙමි
එකදා රැයට තුන්සිය හැටකට උනිමි'

මේ අනුව ඇය පුරුෂයන් රැසක් සේවනය කළ ආකාරය සහ ආර්ථික ශක්තිය ලබා ගත් ආකාරය පිළිබඳ ප්‍රසිද්ධියේ ඉදිරිපත් කර තිබීම තුළින් වෛශ්‍යා වෘත්තිය එකල සමාජයේ සමාජගත පිළිගත් ෘත්තියක් ලෙෂ සමාජගත පැවති ආකාරය සහ ඇතැම් විට විවාහක කාන්තාවන් පවා එකී වෘත්තියෙහි නිමග්න වූ ආකාරය පිළිබඳ තොරතුරු අධ්‍යයනය කළ හැකි වේ. රොබට් නොක්ස් විසින් ලංකාව පිළිබඳව රචනා කළ *'එදා හෙළදිව'* (එදා හෙළදිව 1996: 268) නම් ග්‍රන්ථය තුළින් ද මීට අදාළ තොරතුරු වාර්තා වේ. 'මෙරට තරුණියෝ සලෙලු ජීවිතයට උපන්නෝ නොවෙති. මේ රටෙහි නීතියෙන් බලය ලද ගණිකා නිවාස නැත. එහෙත් මේ වෘත්තියෙහි නිරත වන අය නගරයේ නැත්තෝද නොවෙති. ........... ප්‍රසිද්ධියේ මෙබඳු දේ කිරීම නුසුදුසු බව ඔවුන් දන්නා නමුදු දිවිපෙවෙත රක්නා පිණිස දුප්පත් ස්ත්‍රීහු මෙම ක්‍රියාවෙහි නිරත වෙති.......'' මේ අනුව සමාජයේ පැවති ආර්ථික දුෂ්කරතා මත බොහෝ විට මෙම වෘත්තියට අකමැති වුවත් එම වෘත්තියේ යෙදීමට සිදුවූ බව මෙමගින් පැහැදිලි වේ.

**නිගමනය**

ඉහත කරුණු අනුව පැරණි ශ්‍රී ලාංකේය සමාජය තුළ කාන්තාවන් විවිධ අරමුණු පදනම් කර ගනිමින් සිය ජීවිකා වෘත්තිය ලෙෂ වෛශ්‍යා වෘත්තිය තෝරා ගත් අතරමළු ය පිළිගත් වෘත්තියක් ලෙස සමාජගත කිරීමට අවැසි පරිසරය රජවරුන් විසින් පවා නිර්මාණය කර තිබුණු බව පැහැදිලි වේ. වෛශ්‍යා වෘත්තියෙහි නියැලුනු කාන්තාවන් වෘත්තීය අභිමානයකින් යුක්තව සමාජ අවශ්‍යතාව ඉටු කළ අතර තම ආත්මාභිමානය ද ආරක්ෂා කර ගනිමින් සිය සේවාව කාර්යක්ෂමව සහ සඵලදායීව ලබා

දෙන්නට උත්සාහ ගත් බව පැහැදිලි වේ. එසේ ලිංගික සේවා සපයා දීමේ දී ඇය විසින් ගොඩනගාගත් සදාචාරත්මක රාමුවක පිහිටා ක්‍රියා කළ අතර තම ආත්මාරක්ෂාව ද ඒ ඔස්සේ ස්ථාවර කර ගත්තේ ය. වෛශ්‍යා වෘත්තිය පිළිගත් සමාජ වෘත්තියක් ලෙස සමාජගතව පැවති නිසාම සමාජ දුරාචාරයන් බොහෝමයක් දුරස් වූ අතර මිනිසා කායික සහ චින්තනමය වශයෙන් උද්දීපනයකින් යුක්තව රාජ්‍ය ආර්ථික ප්‍රවර්ධනය උදෙසා සිය දායකත්වය සළසා දුන් බව පැහැදිලි වේ. එහෙත් වර්තමානය වන විට එම තත්ත්වය වෙනස් වී වෛශ්‍යා වෘත්තිය කෙරෙහි සමාජ මතය සෘණාත්මක ආකල්පයක් දරයි. වෛශ්‍යා වෘත්තියේ නීතිගතභාවය පිළිබඳ ගැටලු, වෛශ්‍යා වෘත්තිකයන් අසාධාරණයට ලක් වීම, සමාජ සෞඛ්‍ය ගැටලු උද්ගත වීම, ළමා ගණිකාවන් බිහි වීම, කාන්තා සහ ළමා අපචාර, මහා පරිමාණ ජාවාරම් බිහිවීම වැනි ගැටලු වලට විධිමත් විසඳුම් නොලැබීම නිසා ඒ තුළින් සමාජ අර්බුධ ගණනාවකට මුහුණ පෑමට ලක්ව ඇත. වෛශ්‍යා වෘත්තිය යනු සමාජ අවශ්‍යතා මත පැන නැගෙන්නා වූ වෘත්තියක් බැවින් එය කෙතරම් දුරකට නීතිය මගින් තහනම් කිරීමට උත්සහ කළද එය සමාජයෙන් කිසිඳු විටෙක බැහැර නොවේ. එම නිසා වෛශ්‍යා වෘත්තිය හරහා සමාජීය වශයෙන් පැන නැගෙන ගැටලු විසඳීම සිදු විය යුතු ය. එහිදී වෛශ්‍යා වෘත්තිය කෙරෙහි සාධාරණ නීතිමය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වීම, කාන්තා සහ ළමා සුරක්ෂිතතාවය ඇති කිරීම, විධිමත් සෞඛ්‍ය ප්‍රතිපත්තියක් තුළින් භයානක සමාජ රෝග ව්‍යාප්තිය මර්ධනය කිරීම, ළමා අනාගතය සුරක්ෂිත කිරීම හරහා විසඳුම් ලබා ගැනීමට හැකි වනු ඇත. මේ අනුව මෙම පර්යේෂණයේ නිගමනය වශයෙන් වෛශ්‍යා වෘත්තිය තුළින් පැන නැගෙන්නා වූ සමාජ ගැටලුවලට විධිමත් විසඳුම් ලබා දීම තුළින් වඩාත් සුරක්ෂිත සහ යහපත් සමාජයක් නිර්මාණය කර ගැනීමට දායක කරගත හැකි වනු ඇත.

## ආශ්‍රිත ග්‍රන්ථ


*තිසර සන්දේශය*, (1986), බන්දුසේන ගුණසේකර, කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

*නිකාය සංග්‍රහය හෙවත් ශාසනාවතාරය*, (1987), ගුණරත්න, එල්. (සංස්) කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

*මහාවංසය* (1996), සුමංගල හිමි හා දේවරක්ෂිත, බටුවන්තුඩාවේ (සංස්.), කොළඹ: ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව.

*මයුර සන්දේශය* (1987), ආර්. පෙරේරා, (සංස්.) කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

මයුර සංදේශය, (2018), තිලකසිරි, සිරි, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

මුවදෙව්දාවත, (2015), තිලකසිරි, සිරි, (සංස්.) කොළඹ: හංස ප්‍රකාශකයෝ.

*සද්ධර්මරත්නාවලිය* (1996), කිරිඇල්ලේඤානවිමල හිමි (සංස්.), කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ.

සසඳාවත, (1996), සිරි තිලකසිරි (සංස්) කොළඹ: අනුල යන්ත්‍රාලය.

කාරියවසම්, නන්දසේන, (2021), *කොළඹ ගණිකාවෝ,* කොළඹ :විජේසූරිය ප්‍රින්ටර්ස්.

තිලකසිරි, සිරි, (2008), *යටගිය දවස ගණිකාවත,* කොළඹ :ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

ජයසූරිය, නිලංකා, (1998), ගණිකා වෘත්තියේ සැබෑ මුහුණුවර, කොළඹ: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

බණ්ඩා, එස්. ජේ. සුමනසේකර, (1986), *පහළ ඌවේ ජනකවි*, කොළඹ: රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව.

බර්ට්‍රන්ඩ් රසල්ගේ (1996), *විවාහය සහ සදාචාරය*, (පරි) දයාරත්න ගරුසිංහ, කොළඹ: හංස ප්‍රකාශකයෝ.

මුණසිංහ, ඉන්ද්‍රාණි, (1998), *පැරණි ලක්දිව කාන්තාව,* දෙහිවල: ශ්‍රී දේවී ප්‍රින්ටර්ස්.

මුදියන්සේ, නන්දසේන (2000), *සිංහල ශිලාලේඛන සංග්‍රහය,* කොළඹ: සීමාසහිත ඇම්. ඩී. ගුණසේන සහ සමාගම.

*Inscriptions of Ceylon*, *Vol. I*, (1970) Paranavitana,S., Colombo: Department of Archaelogy.